ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 52/ News/ 2013

ක්‍රි. ව. 2013 පෙබරවාරි 25 සඳුදා
05 වෙළුම - 17 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

# ළමා ප්‍රදීපය



## දරුවන්ට අසීමිතව ආදරය කළ
# අති උතුම් සොලොස්වන බෙනඩික්ට් සසුන් පියා

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# අපගේ ආදරණීය සොළොස්වන බෙනඩික්ට් සසුනිසුරාණෝ

### ආදරණීය දුවේ පුතේ...

ඔබට අසීමිතව ආදරය කළ අති උතුම් සොළොස්වන බෙනඩික්ට් පාප් වහන්සේ පිළිබඳව මේ වන විට ඔබ ගොඩක් කරුණු දැනගෙන ඇති. එතුමාණන් විශ්‍රාම යන බව දැන් හැම මාධ්‍යයකම කියැවෙනවා. මේ කරුණු ඔබම දැන් හොඳට කියවා දැන ගත යුතුයි.

ආදර දුවේ පුතේ, දහසයවෙනි බෙනඩික් පාප්තුමන්. තමන් පෙබරවාරි මස 28 වෙනිදා විශ්‍රාම යෑමට තීරණය කර ඇති බව පසුගිය 11 වෙනිදා කාදිනල් මණ්ඩලය ඉදිරියේ දැනුම්දීමත් සමගම, බොහෝ දෙනෙක් කියා සිටියේ මෙය කිසිසේත්ම බලාපොරොත්තු නොවූ ප්‍රවෘත්තියක් බවය. උන්වහන්සේගේ විශ්‍රාම යෑම පිළිබඳව ලෝකය පුරා විවිධ ක්ෂේත්‍රයන් තුළින් විවිධ මත ප්‍රකාශ වුවත්, ඒ සඳහා උන්වහන්සේ හේතු දක්වමින් කියා සිටියේ දෙවියන් වහන්සේ ඉදිරියේ තමන්ගේ හෘදය සාක්ෂිය බොහෝ වාරයක් පිරික්සා බැලීමෙන් පසු, තමන්ගේ වියපත්වීම නිසා, තමනට පැවරී ඇති දූත සේවාව ඉටුකිරීමට අවැසි ශක්තිය නොමැති බව වටහා ගැනීමෙන් පසුව මෙම තීරණය කරා එළඹි බවය.

2005 අප්‍රේල් මස 19 දින කාදිනල් මණ්ඩලය විසින් ජෝශප් කාදිනල් රැට්සිංගර් හිමිපාණන් පාප් නිලය සඳහා පත් කරගැනීමෙන් පසුව, දහසයවෙනි බෙනඩික් නමින් පාප්ධුරය බාරගත් එතුමා, දැන් 85 වෙනි වියෙහි පසුවෙයි. 'පාප් වහන්සේ කෙනෙකුට විශ්‍රාම යා හැකිද?' මේ සිද්ධියත් සමග බොහෝ දෙනෙක් එසේ ප්‍රශ්න කිරීමට මූලික හේතුව වන්නේ මෑත ඉතිහාසයේ මෙවැනි සිදුවීමක් වාර්තා වී නැති නිසාය.

නමුත් පාප් තුමකු විශ්‍රාම යෑම හෝ ධූරයෙන් ඉල්ලා අස්වීම සහා ඉගැන්වීම් වලට හා සාසන නීතියට අලුත් දෙයක් නොවේ. සාසන නීති සංග්‍රහයේ 332/2 නීති වගන්තියේ සඳහන් වන ආකාරයට, පාප්වහන්සේ තමන්ගේ පදවියෙන් විශ්‍රාම යෑමක් සිදුවිය යුතුනම්, එහි වලංගුභාවය සඳහා එම විශ්‍රාම යෑම නිදහස්ව හා නිසිලෙස ප්‍රකාශයට පත්කළ යුතු අතර, එය කිසිවකු විසින් පිළිගැනීම අවශ්‍ය නොවන්නේය.

ඒ අනුව මෙම සාසන නීති වගන්තිය පැහැදිලිවම පාප්වහන්සේම තමන්ගේ කැමැත්තෙන් විශ්‍රාම යෑම නිදහස්ව හා නිසිලෙස ප්‍රකාශයට පත්කළ යුතු අතර, එය කිසිවකු විසින් පිළිගැනීම් අවශ්‍ය නොවේ. ඒ අනුව මෙම සාසන නීති වගන්තිය පැහැදිලිවම පාප්වහන්සේට තමන්ගේ කැමැත්තෙන් විශ්‍රාම යෑම හෝ සේවයෙන් අස්වීම කළ හැකි බැව් පෙන්වා දෙයි.

එම තීරණය කිසිවකුගේ බලපෑමට හෝ බලකිරීමකට යටත් නොවී නිදහසින් ගතයුතු තීරණයකි. එහි වලංගුතාවය සඳහා අවශ්‍ය වන්නේ කුමන හෝ ආකාරයකින් හෝ සභාවට දන්වා සිටීම පමණි. ඒ අනුව දහසයවෙනි බෙනඩික්ට් පාප්තුමා රැස්ව සිටි කාදිනල් මණ්ඩලය ඉදිරියේ තම විශ්‍රාම යෑම ප්‍රකාශ කිරීමත් සමගම එම ප්‍රකාශය වලංගුවේ.

සභා ඉතිහාසය තුළ පාප්තුමන්ලා 10 දෙනෙකුගේ පමණ ඉල්ලා අස්වීම් හා විශ්‍රාම යෑම් සඳහන් වී ඇතත්, ඒ අතුරින් පස්වෙනි සෙලෙස්තියන් පාප්තුමන්ගේ ඉල්ලා අස්වීම පමණක් ඉතා පැහැදිලි ලෙස වාර්තා වී ඇත. සභාව තුළ සාම්ප්‍රදායික විශ්වාසයට මුල් තැනක් දුන් දහසයවෙනි බෙනඩික්ට් පාප්තුමා දේවධර්මාචාර්යවරයෙකි, භාවනානුයෝගී චින්තකයෙකි, ග්‍රන්ථ කතුවරයෙකි, විශ්ව විද්‍යාල කථිකාචාර්ය වරයෙකි. ඒ හැමදේකටම වඩා තම අදහස් පැහැදිලිව හා නිර්භයව ප්‍රකාශ කරමින් කිතුනු විශ්වාසය ප්‍රකාශ කරමින් ආරක්ෂා කළ සභා එඬේරකු විය.

එක්දාස් නවසිය හැත්තෑව දශකයේ අගභාගය වනතුරු ජෝශප් රැට්සිංගර් එතරම් කතාබහට හෝ කාගේවත් අවධානයට ලක්වූ පුද්ගලයකු නොවේ. 1927 අප්‍රේල් මස 16 වෙනි දින ජර්මනියේ බැවේරියාවේ උපත ලද මෙතුමා, දරු තුන්දෙනෙකුගෙන් යුත් පවුලේ බාලයාය. දොළොස් වෙනි වියේදී තම වැඩිමහල් සොහොයුරාගේ අඩිපාරේ යමින්, 1999 දී පූජකවරය පතා දෙව්සත් හලට ඇතුළත් විය. එදා පැවති ලෝක යුද්ධය නිසා, පූජක පුහුණු කාලය තුළ නොයෙක් කරදර බාධකවලට මුහුණ දුන්නත්, 1951 දී පූජකවරය ලැබීය.

1977 දී මෙතුමා මියුනිච් නගරයේ අගරදගුරු පදවියට පත්ව, පසුව හයවෙනි පාවුළු පාප්තුමන් විසින් කාදිනල් ධූරය සඳහා නම් කළා. පසුව දෙවන ජුවාම් පාවුළු පාප්තුමාගේ ආරාධනයෙන් වතිකානයේ පරිපාලන කටයුතු වලට හවුල් වුණා. දෙවන ජුවාම් පාවුළු පාප්තුමා ස්වර්ගස්ථ වෙද්දී, රැට්සිංගර් කාදිනල් තුමා, කාදිනල් මණ්ඩලයේ ප්‍රධානියා වශයෙන් හා කිතුනු විශ්වාසය පිළිබඳ වතිකාන සංසදයේ ප්‍රධානියා ලෙස කටයුතු කරමින් සිටියා.

සොළොස්වන බෙනඩික් පාප්තුමා විශ්‍රාම යෑමෙන් පසු, ආශ්‍රමික ජීවිතයක් ගත කරන බවත්. මීලඟ පාප්වරණය සඳහා සහභාගි නොවන බවත් ප්‍රකාශ කළ බව විශ්වාස කටයුතු මාර්ගවලින් හෙළිදරව් වී තිබෙනවා.

**ඔබට ජේසු පිහිටයි.**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# ලක්දිව නිකුත් වූ විශේෂිත මුද්දර

## මුද්දර ලෝකය



## හඳුනා ගනිමු

යම් නිශ්චිත දිනයක් - අවස්ථාවක් - සිද්ධියක් හෝ පුද්ගලයෙකුගේ සංවත්සරයක් තේමා කර නොගනිමින් ඒ සියල්ලට පරිබාහිරව මුද්දර නිකුත් කරන විශේෂ අවස්ථාද ඇත. එවන් විශේෂවූ අවස්ථාවල එළිදක්වන මුද්දර විශේෂ භාණ්ඩයේ මුද්දර ලෙස හැඳින්වේ. මෙවන් විශේෂිත මුද්දර, සමාජයේ පවතින විශේෂ රුචිකත්වයක් මුල්කරගනිමින් හෝ ජනතාව වෙත විශේෂ අවධානයට ලක්කළ යුතු කරුණු කාරණා ඉලක්ක කරගනිමින් දොරට වඩී. මෙය කොහෙත්ම සමරු මුද්දර මෙන් නිශ්චිත සැමරුමක් අරබයා කරන්නා වූ නිර්මාණයක් නොවන්නේය. එමෙන්ම වරකට නිකුත්වන සමරු මුද්දර සංඛ්‍යාවකටත් වඩා අඩු ප්‍රමාණයකින් හා එය එක් වරකට පමණක් සීමා කරමින් නිකුත් කරනු ලබයි. මේ අනුව බලන කල මෙම මුද්දර වර්ගයන් වැඩිකල් නොගොස් දුර්ලභ මුද්දර ගනයට එළඹීම වැලැක්විය නොහැක.

1857 වසරෙන් ඇරඹි ලංකා මුද්දර ඉතිහාසයට මේ වනවිට වසර 156 කට ආසන්න කාලයක් ගෙවී ඇතත් අප රටේ විශේෂ මුද්දර නිකුත් කිරීම ආරම්භවී වසර පනහක්වත් ඉක්මවා නැත. එමෙන්ම එම කෙටි කාලය තුළ එවන් විශේෂ මුද්දර නිකුත් වූ අවස්ථාවන් 25 කට වඩා නොමැත. එසේවුවත් එකී කාරණයේදීද විශේෂවූ දුර්ලභ අවස්ථාවක් අපට හමුවේ. එය නම් 2003.09.27 දින එකම තේමාවක් යටතේ වැඩිම විශේෂ කාණ්ඩයේ මුද්දර ප්‍රමාණයක් නිකුත්වීමය. එහි තේමා ව වූයේ "ශ්‍රී ලංකාවේ නිවැසි පක්ෂීන්" ය. එම මුද්දර කාණ්ඩයේ

1. ජලාශ්‍රිත පක්ෂීන් 5 ක් , කාමී භක්ෂ පක්ෂීන් 5ක් , ගොදුරු පක්ෂීන් 5ක්, ,ජල බුදින්නන් හා ඇට බුදින පක්ෂීන් 5ක් , සර්ව භක්ෂ පක්ෂීන් 5ක් යනුවෙන් බෙදා වර්ගකළ විවිධ වර්ගයේ කුරුල්ලන් 25 කින් සමන්විත විය. එම සැම මුද්දරයකම මිල සටහන් ව ඇත්තේ රු.4.50 ලෙසය. එම දර්ශනීය මුද්දර පෙළ "කුරුල්ලන් "තේමා කරගත් මුද්දර එකතු කරන්නන් හට අනගි සම්පතක් වනවා නොඅනුමානය. එම වසරේම අප්‍රේල් 28 වන දින "පුරාණ ලංකාවේ දාගැබ්වල නිර්මාණ ලක්ෂණ" පිළිබඳව දර්ශණීය මුද්දර තුනක් නිකුත් කරන ලදී.

ඒ අතරින් රු 4/50 ක වටිනාකමින් යුත් "ස්තූපයක " අනුරුවක් ද රු. 16/50 ක වටිනාකමින් යුත් "මුරගල හා පඩිපෙළ" දැක්වෙන සිතුවමක්ද, රු50/= ක වටිනාකමින් යුත් සඳකඩ පහන" ඇඳි රුවක්ද නිමැවුම් කර තිබේ.

තවද එම වසරේම නොවැම්බර 11 වන දින රු 2/50 වටිනාකමින් යුත් "රම්බොඩ දිය ඇල්ල "රු. 4.50 කින් යුත් සාන්ත ක්ලෙයාර් දිය ඇල්ල රු 23/= කින් යුත් "බෝපත් ඇල්ල" හා රු 50 කින් යුත් "ඩෙවොන් දිය ඇල්ල " දැක්වෙන මනහර මුද්දර 4 ක්ද නිකුත් විය. ඒ අනුව ලක් මුද්දර ඉතිහාසයේ අනෙකුත් සැම වසරක්ම අභිබවා මෙතෙක් වැඩිම විශේෂ මුද්දර සංඛ්‍යාවක් නිකුත්වූ වසර ලෙස 2003 වසර සනිටුහන් වේ. සෙසු වසරවල විශේෂ මුද්දර නිකුත්ව ඇත්තේ අටට අඩු සංඛ්‍යාවලිනි. ඒ අතර 1980 -12-18 දින "ශ්‍රී ලංකාපැරණි කොඩි" මුද්දර 4 ක් 1992 -08-19 දින "ශ්‍රී ලංකා වෙස් මුහුණු " මුද්දර 4 ක් 2000-08-18 දින "ශ්‍රී ලංකා කොරල් පර" මුද්දර 4 ක් , 2005 -12-26 දින "සුනාමි " මුද්දර 4 ක් 2006-10-02 දින "ශ්‍රී ලංකාවේ පළාත් පුෂ්ප" 4 ක් , 2010-10- 03 දින "ඉබ්බා අහසේ ගිය හැටි" දැක්වෙන මුද්දරයත් මුද්දර ලෝලීන් අතර ජනප්‍රිය වූ බව සඳහන් වේ.

එමෙන්ම ලක් ක්‍රීඩා ලෝලීන් අමන්දනන්දයට පත්කළ "ජගත් ලෝක කුසලානය" ලංකා ක්‍රිකට් පිල ලබාගත් ජයග්‍රහනය නිමිතිකොට 1996 වසරේ නිකුත්වූ විශේෂ මුද්දර 4 ක් ද විශේෂ යෙන් සඳහන් කළ යුතුව තිබේ. එහි රු2/= වටිනාකමින් යුත් "පන්දු යවන්නෙකුගේ" රුවත් රු 10/50 කින් යුත් "කඩුළු රකින්නාගේ "රුවත් රු 17/= කින් යුත් "පිතිකරු" රුවත් හා රු 20/= කින් යුත් "ක්‍රිකට් කුසලාන " ආකෘතියෙනුත් හැඩගැන්වී තිබුණි. එම විශේෂ මුද්දර පෙළට එක්වූ තවත් විශේෂත්වයක් නම් ඒ මුද්දර සියල්ලම ත්‍රිකෝණ හැඩැති මුද්දර වීමයි. ලංකාවේ අතලොස්සක් වූ ත්‍රිකෝණ මුද්දර අතරට එකතු වූ මේ මුද්දර 4 ත් ඉතා දුර්ලභ විශේෂත්වයක් ගන්නවාට සැක නැත. ඔබ සැමත් විශේෂ මුද්දර එකතුකරන්නට විශේෂ උනන්දුවක් ගන්න,

✍ සිරිල් පෙරේරා



1996 වසරේ නිකුත් වූ මුද්දර කාණ්ඩය



2003 වසරේ නිකුත් වූ මුද්දර කාණ්ඩය

# ජේසුස් වහන්සේගේ ආදරය අත් දකිමු

**ආදරය අපි හැමෝටම පුදන්න පුළුවන් ලබාගන්න පුළුවන් නමුත් ඒ ආදරය තුළ ජීවත් වෙන්න අපිට ටිකක් අමාරුයි. ඒ අපි ආදරය ගැන නොදන්න නිසයි.**

ආදරෙයි කියලා කියන්න. ආදරේ කරන්න, ආදරේ කියන වචනෙවත් නොදන්න මිනිසුන් අප අතර කොපමණ සිටිනවාද? ආදරය ගැන නොදන්න පුද්ගලයා ජීවිතයේ අගය නොදනී. ඒ නිසාම අද මිනී මැරුම් , දූෂණ එන්න එන්නම වැඩි වෙලා.



අද අපි ලෞකිකත්වයට වහල් වෙලා. නමුත් එදා පව්කාරියකැයි සලකා ගල් ගැසූ පව්කාර ස්ත්‍රිය ජේසුගේ ආදරය නිසා ඇගේ මුළු ජීවිතයම වෙනස් කර ගත්තා. ඇගේ නෙතින් කඩා වැටුණු කඳුළු ඒ ජේසුගේ ආදරයයි.

එදා ජේසුගේ නෙතින් ලේ කඳුළු වැටුණේ අප මුළු මිනිස් සංහතියටම ඇති ආදරය නිසයි. අපිට ජේසුගේ ආදරය දැනෙන කොට අපේ ඇස්වලින් කඳුළු කඩා හැලෙනවා නොදැනීම. ඒ කඳුළු බිඳු එකතු වෙලා ආදරයේ ගඟක් හැදෙනවා. ඒ නොසිඳී ගලන ගඟ ජේසුගේ ආශිර්වාදයයි. අපිට පුළුවන් නම් අපේ මුළු ජීවිතයම ආදරය කර ගන්න. නපුරින් මිදිලා ජේසුට ලං වෙලා ඉන්න තියෙනවනම් ඊට වඩා වෙන මුකුත් අපිට වටිනවද?

අපි ජේසු ළඟට වෙලා ඉන්නවනම් අපි කාට බිය වෙන්නද. ජේසු අපි හැමෝ ළඟම ජීවමානව වැඩ සිටිනවා. නමුත් අපිට පේන්නෙ නෑ. අපේ ඇදහිල්ලෙ දැස් අන්ධ වෙලා. අපේ ඇදහිල්ල තුළින් ජේසුව, ජේසුගේ ආදරය අත් දකින්නට පුළුවන් නම් එයයි සැබෑ විශ්වාසී කිතුනු ජීවිතය. අප හැම මව් කුසේ සිටියදීම ජේසුගේ කාර්යය සඳහා තෝරා පත් කර ගන්නවා. එසේ උන්වහන්සේගේ කැඳවීමට කැපවී සේවය කිරීමට කුඩා දරුවකු ලෙස මටත් පුළුවන් , ඔබ හැමටම පුළුවන් මෙසේ ''කඳුලක් පුදන්නම් , ළං ළංව ඉන්නම්, නපුරින් මිදීලා , කැපවී සිටින්නම්'' ගයමින් ජේසු තුළ මේ විශ්වාසයේ වසරට සැබෑ අරුතක් දෙමු.

**තිලිණි හර්ෂිකා රුද්‍රිගු**
2012 (අ.පො.ස - සා.පෙළ)
ශාන්ත මරියා දහම් පාසල - උස්වැටකෙයියාව



**සේයා - තිළිණ අලහකෝන්**

**මාසික සිතිවිල්ල**
"පෙබරවාරි මාසය"
ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

## සිසු නායක වැඩමුළුවක්



වැලිහේන ශුද්ධවූ කයිතානු, වැලිහේන මීසමට අයත් දකුණු වැලිහේන, සා. සෙබස්තියන්, හා ඇත්ගාල ශු. මරිය ගොරෙත්ති යන දෙව්මැදුරු හි දහම් පාසල් වල සිසු නායක නායිකාවන් හට වැඩමුළුවක් 2013 මාර්තු 03 වන ඉරුදින පැවැත්වීමට කටයුතු යොද ඇත. මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක දේශක කුමර නයනජිත් මහතා විසිනි. වැලිහේන මීසම් සේවක ගරු නිශාන්ත රුද්‍රිගෝ පියතුමාගේ අදහසකට අනුව මෙය සංවිධානය කෙරේ.

# බටගම සා. අන්තෝනි දහම් පාසලේ ශූර ළමා ලේඛකයෝ

වැඩමුළුවක ප්‍රතිඵලයක්

## හිමිදිරි උදයක අසිරිය

රන් වන් දිනකර අහස් ගැබේ පායා
විහඟුන් ගී සර සැම තැන විහිදීලා
කුසුම් එකතු වී හිරු දෙස හොරෙන් බලා
අලුත් දිනක අසිරිය පෙන්වාලා



හිමිදිරි උදයේ හිරු අප දෙස බලලා
ගිරි මුදුනින් අප වෙත ලංවීලා
ලොවට එළිය දී දවසම හැඩකරලා
නැවුම් බවක් ගෙන දෙයි අප හට සැමදා



බිඟුන් රෑන එයි පේළි සැදීලා
විකසිත වූ මල් වෙත පියඹාලා
උදෑසනින් මල් වැස්සක් වැටිලා
මුළු පොළොතලයම නැවුම් කළා

**මනීෂා මධුරංගි**
10 ශ්‍රේණිය
ශා. අන්තෝනි දහම් පාසල - බටගම

## ආදර ජේසුනි

ජේසුනි ඔබ මගේ ජීවිතයයි
ජීවන ගමනේ සැලසුම ඔබමයි
ජීවිත ගෙවුමේ ගැලවුම ඔබමයි
අත දෙන්න ජේසුනි මේ දිවි ගෙවුමට

**රොමේෂා කවිහාරි කුරේ**
07 ශ්‍රේණිය , ශා. අන්තෝනි දහම් පාසල - බටගම



වීනාවේ තත් අතරින් ඔබේ රුව දකිමි මා
බෙර පදයේ හඬ අතරින් පෙම විඳිමි මා
සිතාරයේ තත් අල්ලා ඔබේ ගුණ වයමි මා
මේ දිවියේ සැමදා ඔබ ළඟ සිටිමි මා

**දිස්මි මිෂෙල්**
08 ශ්‍රේණිය
ශා. අන්තෝනි දහම් පාසල - බටගම



**ඉසුරු පියුමන්ත ජයමාන්න**
10 ශ්‍රේණිය
ශා. අන්තෝනි දහම් පාසල
බටගම



**මලිඳු නිශාන් කොස්තා**
09 ශ්‍රේණිය
ශා. අන්තෝනි දහම් පාසල - බටගම

## මව්පිය සෙනෙහස

දස මස මා කුසේ දරාලා
ලේ කිරි කර පොවාලා
මා ලෙඩ වූ විට මා ළඟ
ඉන්නා
මගෙ ආදර අම්මා .....

දහඩිය හෙලා මා
පෝෂණය කරලා
නැගිටින්නට මා හට අත
පොවලා
අවශ්‍ය දේවල් ගෙනවිත්
දෙන්නා
මගෙ ආදර තාත්තා ......

සැමදා ආදරයෙන්
අමතාලා
නිවැරදි මඟ කියලා දීලා
නිතරම මා රැක බලා ගන්න
ආදර දෙමාපියන් ......



**ජයනි කෞශල්‍යා පෙරේරා**
09 ශ්‍රේණිය
ශා. අන්තෝනි දහම් පාසල
බටගම

# 2013 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

71. ''භාග්‍ය අට ජේසුස් වහන්සේගේ දර්ශනය පිළිබඳව කදිම මග පෙන්වීමකට අප සැම දෙනා යොමු කරයි.''

1. භාග්‍ය අට පිළිබඳව කරුණු ගෙන හැර දක්වන සුවිශේෂකවරු දෙදෙනා කව්ද? එම දේශනයන් කිනම් නම්වලින් හඳුන්වන්නේද?

2. කිසියම් පුද්ගලයෙක් භාග්‍යවන්ත ද කියා සොයා බලන ක්‍රම තුනක් නම් කරන්න.

3. භාග්‍ය අට මගින් ගෙන හැර දක්වන ඉගැන්වීම් පහක් වර්තමාන සමාජය තුළ ජීවත් කළ හැකි ආකාරය පැහැදිළි කරන්න.

72. ''සුවය ලබන්නට අපේ විවෘත භාවය හා විශ්වාසය අත්‍යවශ්‍ය වේ''.

1. ඇදහිල්ල නිසා සැනසීම ලැබූ සිද්ධීන් දෙකක් සුබාරංචි ග්‍රන්ථ ඇසුරින් ඉදිරිපත් කරන්න.

2. ප්‍රාතිහාර්යයක් දේව රාජ්‍යයේ සලකුණු වන්නේ කෙසේද? ප්‍රධාන කරුණු තුනක් මතු කරමින් පැහැදිලි කරන්න.

3. විවිධ වහල්කම්වලින් පීඩා විඳින ජනතාව මුදා ගන්නට ජේසුස් වහන්සේ ගෙනහැර දැක්වූ දේව රාජ්‍යයේ සලකුණු හතරක් නම් කරන්න.

73. 1. පාස්කු අභිරහස යනු කුමක්ද?

2. කතෝලික සභා ධර්මෝපදේශය පෙන්වා දෙන පරිදි සුබ අස්නේ හදවත කුමක්ද?

3. උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ සභාවට පැවරූ වගකීම් තුන අදාළ බයිබල් පාඨ සහිතව පැහැදිලි කරන්න.

4. ජේසුස්වහන්සේ ගෝලයින්ට පැවරූ වගකීම් තුන කුමක් ද?

74. නව ගිවිසුමේ පෙන්තකොස්ත මංගල්‍යය යනු කුමක්ද?

75. පෙන්තකොස්ත මංගල්‍ය දින ශුද්ධාත්මයාණන් ප්‍රකාශ වූ සලකුණු දෙකක් නම් කරන්න.

76. ශුද්ධාත්මයාණන් පැමිණි කළ ලෝකයාට වටහා දෙන්නේ කුමක් පිළිබඳව ද?

77. මුල් ක්‍රිස්තියානි සභාවේ පැවති ආධ්‍යාත්මික ලක්ෂණ තුනක් ලියා දක්වන්න.

78. මැක්ෂිමිලියම් කෝල්බේ පියතුමා තුළ ශුද්ධාත්මයාණන් වහන්සේ ක්‍රියාකාරී වූ අන්දම විස්තර කරන්න.

79. කල්කටාවේ තෙරේසා මව්තුමිය කරන ලද සේවය කුමක්ද?

80. නොවරදින සුළු භාවය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

81. ශුද්ධ වූ කතෝලික සභාව දේව අනාවරණය අපට පහදා දෙන්නේ කෙසේද?

82. දේව අනාවරණය අත්දකින අපගේ ප්‍රතිචාරය කෙබඳු විය යුතුද?

83. පෘතුගීසි ධර්මදූත සේවය මෙරට සාර්ථක වීමට බලපෑ හේතු කවරේ ද?

84. පෘතුගීසි සමයේ ප්‍රථම ධර්මදූත කණ්ඩායම ලෙස මෙරට සේවය කළ පැවිදි නිකාය කුමක්ද?

85. ශ්‍රී ලංකාවේ කිතුනු ඇදහිල්ල පණ ගැන්වූ පෘතුගීසි සමයේ පුරෝගාමී පැවිදි නිකායන් නම් කරන්න.

86. ලන්දේසීන් විසින් කතෝලිකයන්ට ඇති කළ පීඩන ප්‍රතිපත්ති කවරේ ද?

87. ලන්දේසි පීඩන සමයේ මෙරට කතෝලික විශ්වාසය රැකදුන් පියතුමා කවුරුන්ද?

88. ලන්දේසි පීඩන සමයේ මෙරට කතෝලිකයන්ගේ විශ්වාසය රැකදුන් පැවිදි නිකාය කුමක්ද?

ගරු ඩේමියන් පෙරේරා පියතුමා

# ක්‍රිස්තියානි කලාවේ අගතැන්පත් කලාකරුවෝ මධ්‍යතන යුගය 07

## චිත්‍ර කලා ශිල්පී ගියොට්ටෝ (1266 - 1337)

සංගීතය හා නාට්‍ය වැනි කලා ශිල්පවල ආරම්භය හා විකාශනය රදගුරු දේව මැදුරුවලට සම්බන්ධ වී තිබීමෙන් යුරෝපීය සංස්කෘතිය මත ඒවායේ බලපෑම කෙතරම් විශාලද කියා තේරුම් ගත හැකිය. ගෝත්‍රික ක්‍රමයේ ගොඩනැගිලි කලාව රදගුරු දෙව්මැඳුරු වඩා බලවත් කිරීමට ද ප්‍රතාපවත් කිරීමට ද විශාල රුකුලක් වූ බව නොකිවමනාය. එහෙත් එම ගෝත්‍රික ගොඩනැගිලි ක්‍රමය අගය කෙරුනේ ඇල්ප්ස් කඳුවැටියට උතුරින් පිහිටි යුරෝපීය රටවල පමණි. රදගුරු දෙව්මැඳුරු මුලින්ම ඉදිකරනු ලැබූ ඉතාලිය තුළ ගෝත්‍රික ක්‍රම කිසිසේත් ජනප්‍රිය වූයේ නැත.

ඉතාලිය තුළ එය එතරම් අගය නොකෙරුණා පමණක්නොව, එය තරමක්දුරට පාච්චලයට ද ලක්විය. ප්‍රංශය තුළ බිහි වූ ඒ ගොඩනැගිලි රටාවට "ගෝත්‍රික" යන නම පළමුවෙන් ම දෙනු ලැබුණේ ඉතාලි ජාතිකයින් විසින් ය. එසේම එයට නිග්‍රහ කිරීමේ අදහසකින් ය. ගෝත්‍රවරු ක්‍රි.ව. 410 දී රෝමය ආක්‍රමණය කළ ම්ලේච්ඡ ගෝත්‍රික ජාතියක් විය. "ගෝත්‍රික" යන නම ඔවුන් විසින් භාවිත කරනු ලැබුවේ එම නව ගොඩනැගිලි ක්‍රමය ම්ලේච්ඡ ගණයකට අයත් වූ එකක් බව දැක්වීමට ය.

මධ්‍යකාලීන යුගය තුළ ඉතාලියෙන් කලාවට සේවයක් වූයේ ගොඩනැගිලි අංශයෙන්ම නොවේ. වෙනම අංශයකින් ය. එනම් චිත්‍ර අංශයෙන් ය. එහි ප්‍රමුඛයා වූයේ ප්ලොරන්ස් නගරයේ උපත ලබා අවු. 70 ක පමණ කාලයක් ආයු වළඳා 1337 දී අපවත් වු ගියොට්ටෝ ඩි බොරිඩෝනේ ය. ඔහු චිත්‍ර කලාව අලුත්ම අතකට හැරවීය. ඔහුගේ දක්ෂකම නිසා ඉතාලියේ රදගුරු දෙව්මැඳුරු අලංකාර කිරීමට බොහෝ විට ඔහුව යොදාගනු ලැබුණේය. ඔහුගේ චිත්‍ර නිර්මාණ නිසා එම දෙව්මැඳුරු විශිෂ්ටත්වයට පත් විය.

ඉතාලියේ දේවස්ථාන "ගෝත්‍රික" ක්‍රමයට නැඹුරු වූයේ නැත. ඉතාලි ගොඩනැගිලිකරුවෝ පැරණි රෝමානු ක්‍රමයට නව අංග ඇතුළත් කර "රෝමනස්ක" හෙවත් "මධ්‍යකාලීන රෝමානු" යන ක්‍රමය බිහි කළහ. එම ක්‍රමයේ දේවස්ථානවල බිත්ති ඝණ විය. ජනෙල් කුඩා විය. එහෙත් ඉතාලි ජාතිකයෝ බිත්තිවල ඝණකම හා ජනෙල්වල කුඩාකම සැලකුවේ අවාසියකට වඩා වාසියක් සේය. ඉතාලියේ උෂ්ණ දේශගුණය තුළ දේවස්ථානවල ඇතුළත සිසිල්ව තබා ගැනීමට එය මහඟු උපකාරයක් විය. පුළුල් බිත්ති ද විශාල චිත්‍ර සඳහා යොදාගත හැකිවිය.



**ප්‍රෙස්කෝ චිත්‍ර :-** නව දේවස්ථාන බහුලව ඉදිවෙමින් තිබුණ මෙම යුගයේ දී අලුත් බිත්තිවල චිත්‍ර ඇඳීමේ අලුත් ක්‍රමයක් බිහිවෙන්නට විය. ඒ බදාම වේලීමට පෙර එය මත චිත්‍ර ඇඳීමේ ක්‍රමය ය. "අලුත්" යන ඉතාලියානු වචනය ආශ්‍රයෙන් ඒවා "ප්‍රෙස්කෝ" යනුවෙන් හැඳින්වෙන්නට විය. "අලුත් බදාම චිත්‍ර" සේ වුවද සිංහලෙන් ඒවා හැඳින්විය හැකිය. ඉතාලියේ දේවස්ථානද ගෙවල් ද සැරසීමේ ක්‍රමයක් වශයෙන් මෙම "අලුත් බදාම චිත්‍ර ක්‍රමය" ඉතාමත් ජනප්‍රිය විය.

ගියෙට්ටෝගේ කලා කුසලතා පෙනී යන්නට පටන් ගැනීමත් සමඟ අසීසියේ ප්‍රැන්සිස් තුමාගේ නමින් එම නගරයේම ඉදිවෙමින් තිබුණ දේවස්ථානයේ බිත්ති සැරසීම සඳහා ඔහුව යොදාගනු ලැබුණේ ය. එය ඔහුට අලංකාරවත් කිරීමට ලැබුණු පළමු දේවස්ථානය ය. සාන්තුවරයාගේ ජීවිතයේ විවිධ සිදුවීම්වල දර්ශන ඔහු එහි බිත්තිවල ඉදිරිපත් කෙළේය. එතෙක් සම්ප්‍රදායානුකූල වූ බිසන්තියාන චිත්‍රවලට වඩා ඒවා බොහෝ සෙයින් වෙනස් විය. බිසන්තියාන චිත්‍ර ලෝකෝත්තර ගාම්භීරත්වයකින් යුක්ත විය.

රූප දලදඬු විය. නැමෙන වැනෙන ගතියක් ඒවායේ නොවීය. හැමවිටම රන්පාට පසුබිමක් මත දක්වන ලද මුහුණු කෙළින්ම ඉස්සරහා බලාගෙන ඉන්න ඒවා විය. එහෙත් ගියොට්ටෝ මිනිසුන් මෙලොවෙ ඉන්න මිනිසුන් සේම සලකා ඔවුන් ඔවුන්ගේ සාමාන්‍ය හැඩය හා දෛනික හැසිරීම අනුවම දැක්වීය.

**සංස්කාරක පියතුමන් විසිනි**

**2005 අප්‍රේල් 19 වැනිද වතිකානයේ සිස්ටයින් දෙව්මැදුරේ දුම් බටයෙන් සුදු පැහැති දුම් රොටු ඉහළ නගිනු දුටු සාන්ත පීතර චතුරස්‍රයට එක් රොක්වී සිටි ලක්‍ෂ සංඛ්‍යාත පිරිස ''හබේමුස් පාපාම්'' ''හබේමුස් පාපාම්'' කියමින් ඔල්වරසන් හඬ නැගුහ. එහි තේරුම නම් අපට පාප්තුමකු ලැබී ඇතැයි යන්නයි.**



2013 පෙබරවාරි 11 වැනි සඳුද පැතිර ගිය ආරංචියකින් කියැවුණේ සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා ඉල්ලා අස්වන බවයි. වඩාත් පැහැදිලි සරල බසින් ප්‍රකාශ කරන්නේ නම් විශ්‍රාම ලබන බවයි. සමස්ත ලෝකයම වික්ෂිප්ත කළ මේ නිවේදනයෙන් කතෝලිකයෝ කම්පා වූහ. හඬා වැටුණාහ. අප අසා තිබුණේ ශුද්ධෝත්තම පියතුමන් සග සුව දිනන බව මිස විශ්‍රාම ලබන බව නොවේ. එහෙත් අති උත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමාට පෙර මීට වසර හයසියයකට ඉහත වර්ෂ 1415 දී අති උත්තම දෙළොස්වන ග්‍රෙගරි ශුද්ධෝත්තම පියතුමා සභා වේද භේදයන් හේතුකොටගෙන කතෝලික සභාව බරපතළ අර්බුදයකට මුහුණ දුන් අවස්ථාවේ ඉල්ලා අස්වූ අතර ඊට පසු එවැන්නක් වාර්තා වන්නේ මෙවරය.

වර්ෂ 1927 අප්‍රේල් 16 වැනිද දකුණු දිග ජර්මනියේ බැවේරියාවේ මැක්ටල් ඇම් ඉන් හිදී උන්වහන්සේ උපත ලැබූහ. බැවේරියාවේ පාරම්පරික ගොවි පවුලකින් පැවත ආ පොලිස් නිළධාරියකුගේ පුතකු වූ එතුමා සිය වැඩිමහල් සොයුරු ජෝර්ජ් රැට්සිංගර් මග යමින් පූජකවරය ලැබීය. ගුරු වෘත්තියට යොමුවූ එතුමා මියුනිච් සරසවියෙන් දර්ශනය හා දේවධර්මය හදරා ආචාර්ය උපාධිය දිනා සිවු වසරකට පසු සරසවි ආචාර්ය මණ්ඩලයට එක් විය. ගරු ජෝශප් රැට්සිංගර් පියතුමා බොන්, මුන්ස්ටර්, ටියුබින් යන නගරවල ඉගැන්වීමේ නියැළුණු අතර 1969 සිට ජෙන්ස්බර්ග් සරසවියේ උපසභාපති ලෙස මෙන්ම කථිකාචාර්ය ධුරයද දැරීය.



දෙවන වතිකාන කතිකාව පැවැත්වෙද්දී කොලොන් අගරදගුරු අතිඋතුම් ජෝශප් ප්‍රින්ස් හිමිපාණන්ගේ උපදේශකයකු වූ එතුමා වඩාත්



සුදොතුම් පියාණන් ත
ගරු ජෝර්ජ් රැට්සිං

# සසුන් පියාණෙනි ඔබවහන්සේට සුබ ගමන් !





පාප්තුමකු පත් වූ වග දැනුම් දෙමින් වතිකානයේ සිස්ටයින් දේව්මැදුරේ දුම් බටයෙන් සුදු පැහැති දුම් රොටු පිටවන ආකාරය

ප්‍රකට වුයේ ගත්කතුවරයකු වශයෙනි. නාසරෙත් හි ජේසුස් වහන්සේගේ ජීවිතය අළලා පොත් පෙළක් රචනා කළ උන්වහන්සේ එහි අවසාන කොටස මේ මෑතකදී නිකුත් කළේය.

1977 දී අති උතුම් සවැනි පාවුළු සසුනිසුරාණන් විසින් අගරදගුරුවරයට එසවූ අතර ජුනි 27 ද කාදිනල් වරයට ඔසවාලීය. 1981 දී අති උතුම් දෙවන ජුවාම් පාවුළු සසුන් පියතුමන් එතුමාව වතිකානයේ විශ්වාස වර්ධන සංඝයේ අධිපති ලෙස පත්කළේය. 2005 අප්‍රේල් 24 වැනිදා සසුන් පිය පදවි ප්‍රාප්තවු උන්වහන්සේ ඉකුත් අට වසර පුරා සමස්ත කතෝලික සභාවේ විශ්වාස වර්ධනයට නව කඩඉම් සළකුණු කරන්නට මහත් වෙහෙසක් ගත්හ. යුරෝපාකරයෙන් අඩපණ වන කතෝලික විශ්වාසය යළි සවි ගන්වමින් පණ ගන්වන්නට තරුණ පරපුර ඉලක්ක කරගත් උන්වහන්සේ ඒ සඳහා විවිධ වෑයම් දරමින් කටයුතු කළහ.

මේ සියල්ල මැද වියපත් වීම වලකන්නට එතුමාටද නොහැකි විය. මේ නිසාම දෙවිදුන් ඉදිරියේ සිය හෘදය සාක්ෂිය අවදි කරමින් පිළිතුරු සෙවූ උන්වහන්සේ අවසානයේ ඊට අවනත වූහ. සියවස් හයකට පසු සසුන් පිය ධූරයෙන් විශ්‍රාම ගැනීම සනිටුහන් කරමින් වතිකානයේ පැවැති සාන්තුවරයට එසවීමේ මෙහෙයකදී සිය ඉසිඹු ලැබීම අනාවරණය කළේය. පෙබරවාරි 28 වැනිදා ඉතාලියේ වේලාවෙන් පස්වරු තුනට සිය ධූරයෙන් විශ්‍රාම ලබන අති උත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා එදින පස්වරු 5 වන විට සසුන් පිය විවේක නිවහන වන ගන්ඩොල්ෆෝ වසන්ත මැදුරට නික්ම යන්නේය. ඉන් පසුව ටික කලක් එහි රැඳී සිටීමෙන් පසු එතුමා වතිකානයේ ධ්‍යානශීලි ආරාමයක යැදුමෙන් හා ධ්‍යානයෙන් යුතු නිහඬ දිවි පෙවතකට පිය මනින්නේය.

**සසුන් පියාණෙනි ඔබ වහන්සේට සුබ ගමන් .....**



ම වැඩිමහල් සොයුරු
ගර් පියතුමන් සමඟ



**ශිරාන් මෛත්‍රි**



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 88

## SINCE, FOR

ඒ ක්‍රියාව අනිවාර්යයෙන්ම වර්තමානයට සම්බන්ධ විය යුතුයි.
She has been working **since October to December.**
කියන්න බෑ වැරදියි. ✗
It has been raining **since 3 p.m. to 6 p.m.** කියන්න බෑ. වැරදියි. ✗

Since කියන වචනය කාල පරාසයක් ගැන, යම්කිසි නිශ්චිත කාල වකවානුවක් ගැන කීමට යෙදීම සම්පූර්ණයෙන්ම වැරදියි. since යෙදෙන්නේ කාල පරාසයක් ගැන කීමට නොවේ. යම් කාල සන්ධිස්ථානයක සිට වර්තමානය දක්වා කියන අදහස ප්‍රකාශ කිරීමටයි.

She has been working since October. ඒක නිවැරදියි. ඒකෙන් කියැවෙන්නේ ඔක්තෝබර් සිට අද දක්වා, මේ දක්වා ඇය වැඩකරන බවයි.

It has been raining since 3 p.m. කියන එක නිවැරදියි. ඒකෙන් කියැවෙන්නේ සවස තුනේ සිට මේ දක්වාම නොකඩවා වහින බවයි.

ශිරානි පසුගිය දහවෙනිදා සිට අද දක්වා මේ සමාගමේ වැඩ. කියන අදහස ලියැවෙන්නේ මෙහෙමයි.
Shirani has been working since the 10 th of last month.
ඒ වගේම ඉහත වැකියේ, Shirani has been working since one month කියල යෙදුවොත් ඒක නිවැරදි යෙදුමක් නෙමේ.

Shirani has been working since June. වගේ නිශ්චිත කාල සන්ධිස්ථානයක් යොදන එක තමයි නිවැරදි.

පසුගිය මාසය මුළුල්ලේ කියන අදහස සඳහා **since one month කියල යෙදීම වැරදියි.**
නාමල් ගිය ඉරිදා ඉඳල අද දක්වා අසනීපෙන්. කියන්නෙ මෙහෙමයි.
Namal has been sick **since last Sunday.** ✔
Namal has been sick **since one week** කියන්න බෑ. වැරදියි. ✗
Namal has been sick **for one week** ✔

මේ ඉහත සඳහන් වැකි ඇසුරෙන් since සහ for කියන වචන යොදන හැටි හොඳින් අවබෝධ කරගන්න.

Since යෙදෙන්නේ යම් දිනක හෝ කාල සන්ධිස්ථානයක සිට අද / මේ දක්වා කියන අදහස සඳහායි.

**for යෙදෙන්නේ යම්කිසි කාල ස්ථාන දෙකක් අතර කාල පරාසය ගැන කීම සඳහා බව ඉතා පැහැදිලිව අවබෝධ කරගන්න.**

බලන්න මේ වැකිය දිහා.

I have not seen you since a long time. මේ වාක්‍ය වැරදියි. දිගුකාලයක සිට මම ඔබව දැක්කෙ නෑ කියන අදහස වැරදියි. දිගුකාලයක් තුළ "මුළුල්ලේ" මම ඔව දැක්කෙ නැහැ කියන අදහසයි නිවැරදි. ඒ නිසා

I have not seen you for a long time කියන වැකිය තමයි නිවැරදි.

It is a long time since I last saw you.
(ඉට් ඉස් ලෝන්ග් ටයිම් සින් අයි සෝ යූ) ඒ වැකිය නිවැරදියි. "මම ඔබ අවසාන වතාවට දැකපු දවසෙ සිට අද දක්වා බොහෝ කාලයක්" කියන අදහස නිවැරදිව ඒ වැකියෙන් කියැවෙනවා.

කාලෙකට පස්සෙ කාවහරි මුණගැහුනම සමහරු නිතර මේ විදියට කියනවා.

I am seeing you since a long time.
(අයැම් සීං යූ සින්ස් අ ලෝන්ග් ටයිම්) මේ නිවැරදි වැකියක් නෙමෙයි. ඔබ කිව යුත්තේ,

I have not seen you for a long time. නැත්නම් It is a long time since I last saw you. යනුවෙනුයි.

ඒ වගේම යම්කිසි කාල පරිච්ඡේදයක් ගැන කතාකරද්දී එම කාල පරිච්ඡේදයේ මුල සහ අග ගැන සටහන් කිරීමට යොදා ගන්නේ **from** සහ **to** යන වචන දෙකයි.

**නිදසුන්:-**
I had been working **from** July 2005 **to** August 2006 in that company.(අයි හැඩ් බීන් වර්කිං ෆ්‍රොම් ජුලයි 2005 ටු ඕගස්ට් 2006 ඉන් දැට් කම්පැනි) මම අර කොම්පැනියේ 2005 ජූලි මාසේ සිට 2006 අගෝස්තු දක්වා වැඩකරලා තියෙනවා.




# නරක මිතුරු ඇසුර.....

ජී.ඒ. නිමාලි ප්‍රනාන්දු
ගුරු මව

බස්නාහිර පළාතේ විවිධ වැරදි වැඩ වලට හසුවූ රැඳවුම් මධ්‍යස්ථානයක දිවි ගෙවන එක් දරුවෙකු මුහුණ දුන් අවාසනාවන්ත සිදු වීමක් පිළිබඳව සහ එයින් ගතහැකි ආදර්ශයන් පිළිබඳව වදන් කීපයක් ඔබත් සමග බෙදු හද ගන්න මා කැමතියි.

මා මීට වසර කිපයකට පෙර වසර එකහමාරක් පමණ සතියකට දින දෙකක් පමණක් හවස් වරුවේ මෙම රැඳවියන් සමග, ජීවිතය පිළිබඳව වදනක් බෙදු ගන්න, සිංහල භාෂාව උගන්වන්න, කාලය වෙන්කර ගත්ත. මා එම ස්ථානයට යන අවස්ථාවේ බොහෝ රැඳවියන් ප්‍රමාණයක් මාත් සමග කථා කිරීමට කැමැත්තක් දැක්වුවත් පෞද්ගලිකව කථා කිරීමට හැකියාව තිබුනේ ටික දෙනෙකු සමගයි. මේ අය සමග කථා කරන විට මට පැහැදිලි වුනා බෞද්ධ වගේම කතෝලික සුපිරි පාසල් වල ඉගෙනුම ලැබූ කීප දෙනෙක්ම රැඳවුම් නියෝග ලබා මෙම රැඳවුම් මධ්‍යස්ථානයේ සෙවන ලබන බව.

ඔහුව අපි සමන් යන අනවර්ථ නාමයෙන් හඳුන්වමු. සමන් කොළඹ ප්‍රදේශයේ සුපිරි පාසලක ඉගෙනුම ලැබූ දරුවෙක්. සමන්ගේ පියා විධායක ශ්‍රේණියේ නිලයක් දැරූ කෙනෙක්. සමන්ට සියලුම සැප සම්පත් පහසුකම් ලබා දෙන්න ඔහුගේ පියා සැමවිටම උත්සහ කළා මොකද සමන්ට තිබූ අසීමිත ආදරය නිසා, සැප සම්පත් මැද හැදුනු වැඩුනු සමන් වැඩි කල් යන්නට මත්තෙන්ම නරක මිතුරු කණ්ඩායමකට හසු වෙනව. හැබැයි ඒ නරක මිතුරු කණ්ඩායම අයුතු ක්‍රමයකට විශාල ලෙස මුදල් උපයා ගන්න හුරු පුරුදු වෙලයි හිටියේ. ඒ විතරක් නොවෙයි. සැබෑ ලෝකෙන් මිදී මනෝලෝක තුළ තති වෙන්නත් මේ අය දැඩි ඇල්මක් දැක්වූවා. මේ සඳහා ශරීරයට මෙන්ම මනසටද හානිකර විවිධ දේ පාවිච්චි කළා. මේ ආකාරයෙන් නරක මිතුරන් සමග ඇසුරට වැටී තිබුන අවස්ථාවක තමයි සමන් පොලීසියට කොටු වුනේ. ඒත් අද සමන්ගේ ජීවිතය හරිම දුක්බරයි සමන්ගේ දුක්බර කථාව අවසන් කර අවසානයේ සමන් කියනව ටීචර් මම මගේ දෙමව්පියන් ගුරුවරුන් දුන් අවවාද පිළිගත්තා නම් මට මෙහෙම දුකක් වෙන්නෙ නැති බව. ආදර දුවේ පුතේ ස්වර්ණ ලතා කවීශ්වරයන් මෙහෙම කියනවා ජීවිතයේ ඉහලම දුක විඳලා මා නෙත් පිබිදු අම්මේ, ඔබයි ලෝකයේ පැවැතුම සැදුවේ දයාව පිරි හදවතින්

ආදර දුවේ, පුතේ අම්මලා අපිව හදන්න හෙලු දුක් කඳුළු හිතේ දරා ගෙන මතක තියාගෙන දෙවිඳුන් අදහගෙන දිවි ගෙවනවා නම් අපේ ජීවිත කවදකවත් වරදින්නේ නෑ අපිට අපේ ජීවිත ලස්සන කර ගන්න අවස්ථාව ලැබෙනවා. වාගේම අනිත් අයගේ ජීවිතත් ලස්සන කරන්න පුළුවන්






කිරි මැටියාන ශු. ජෙරාඩ් මයෙල්ලා දේවස්ථානයේ දහම් පාසල් දරු දැරියෝ 37 ක් පසුගියද ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබුහ. දේව මෙහෙය මීසම් සේවක ගරු මේරියස් ප්‍රනාන්දු පියතුමන් විසින් පැවැත්විය.

එම දරුවන් ගරු පියතුමා සමග ළමා ප්‍රදීපය සඳහා සමූහ ඡායා රූපයකට පෙනී සිටි අයුරු. **(සටහන - චාල්ස් ප්‍රනාන්දු - සේයා ඇලෙක්ස් )**

හලාවත පදවිය



**ගොයම් කපන ළඳුන්**
සඳනි ලක්ෂිකා
10 ශ්‍රේණිය
ලූර්දු මාතා
දහම් පාසල
නාත්තන්ඩිය



**අපගේ ආදර දේව අම්මා**
මෙවනි
රොෂෙට්
බුල්නර්
06 ශ්‍රේණිය
ගැලවුම් කරුවාණන්ගේ
දෙව් මැදුර
මාකෙවිට

**මෝසෙස් තුමා**
රසාරි
සුසිරංගිකා
ප්‍රනාන්දු
07 ශ්‍රේණිය
ශුද්ධවූ පවුලේ
බලිකා මහ
විද්‍යාලය
වෙන්නප්පුව



**වෙරලේ සැන්දෑවක්**
තිමිර
රවිශාන්
09 ශ්‍රේණිය
ලොයොලා
විද්‍යාලය
මීගමුව





**අපගේ ගැලවුම්කරුවාණෝ**
නිපුනි නිමේෂිකා
10 ශ්‍රේණිය
ශුද්ධවූ පවුලේ දහම් පාසල - රාජකදළුව




පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංති භාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**ලූර්දු දේව මාතාවන්**
කමායා දේවින්දි
08 ශ්‍රේණිය
ලූර්දු දේවමාතා දහම් පාසල
පොල්ගහවෙල

# ශුද්ධවූ අතනාසියුස් මුනිතුමා

## සුදුවර චරිතයක් හඳුනාගනිමු





ක්‍රි.ව 296 දි ඇලෙක්සැන්ඩ්‍රියාවේ උපත ලද මෙතුමාගේ දෙමව්පියෝ ක්‍රිස්තු භක්තිකයෝ වූහ. මුලින් ම කිතුනු අධ්‍යාපනයක් නොලද අතර මෙතුමා කුඩා කල සිටම තාපස දිවියට ඇඩි ඇල්මක් දැක්වූ අතර, සිය යොවුන් වියේදී විධිමත් අධ්‍යාපනයක් ලබන්නට මෙතුමාට හැකිවූ අතර, එමගින් උගත් බුද්ධිමත් අයෙකු වූ බැවින් ක්‍රි.ව. 325 දී පළමු ජගත් මන්ත්‍රණ සභාව වූ නිසියානු මන්ත්‍රණ සභාවට සහභාගි වන්නටද හැකිවිය.

මෙම මන්ත්‍රණ සභාවේදී ඒරියස් වාදයට විරුද්ධව කථා කරන්නට ඔහුට ද හැකිවිය. මේ නිසා ම එතුමා සිය දිවියේ වැඩිකාලයක් ගත කළේ ඒරියස්වාදයට විරුද්ධ ව සටන් කිරීමටය. මේ නිසා ම නිසියානු මන්ත්‍රණ සභාවේ ප්‍රබල දීප්තිමත් , කීර්තිමත් පුද්ගලයකු ලෙස මෙතුමා නම් කළ හැකිය. ක්‍රි.ව. 326 දී ඇලෙක්සැන්ඩ්‍රියාවේ රදගුරුධුරයට පත් වූ මෙතුමා එහි විසූ ගිහි, පැවිදි සියලු දෙනාගේම භක්ත්‍යාදරයට හා ජනාදරයට පාත්‍රවිය. ගිහි, පැවිදි දෙපක්ෂයේම ප්‍රසාදය ලැබීම හේතුවෙන් මෙතුමා ලිබියාව, ඊජිප්තුව ආදි ප්‍රදේශයේ සැරසමින් සෙනඟ දිරිගන්වමින් විශාල සේවයක් කළේය. අන්තවාදි තර්ජනයෙන් ප්‍රදේශ බේරා ගැනීම මෙතුමන්ගේ අරමුණ විය. දුර්මතධාරියකු ලෙස සභාවෙන් ප්‍රතික්ෂේප කළ එරියද් සභාවට යළි පිළිගන්නා ලෙස රෝම අධිරාජයාගේ බලකිරීම් වලට මෙතුමා එකඟ වුයේ නැත. ඒරියස්ට පක්ෂව සිටි නිකොමියාවේ රදගුරුතුමා යුසේබියස් අධිරාජයාගේ බලතල ලබාගනිමින් එරියස් සභාවට පිළිගන්නා ලෙස බලකළහ. නැවත නැවත විවිධ චෝදනා අතනාසියුස් තුමාට විරුද්ධව යුසේබියස් විසින් අධිරාජයාට ඉදිරිපත් කිරීම නිසා ක්‍රි.ව. 335 දී අතනාසියුස් තුමා අගරදගුරුධුරයෙන් පහකරන ලදි. මේ නිසා ම ට්‍රිමීස් නම් ස්ථානයට පලා ගියේය.

ක්‍රි. ව 337 දී අගරජ මිය ගිය නිසා ඇලෙක්සැන්ඩ්‍රියාව ආපසු පැමිණි මෙතුමාට නැවත වරක් තම විරුද්ධවාදීන්ගේ තර්ජන නිසා නැවත රටින් පිටමං වීමට සිදුවිය. ක්‍රි.ව. 339- 346 අතර ඔහු වැඩිපුර ගතකළේ රෝම නුවරය. ක්‍රි.ව. 346 කොන්ස්තන්තිනෝපල් අධිරාජයාගේ පුත්‍ර කොන්ස්තන්ස්ගේ ප්‍රසාදය දිනාගත් අතනාසියුස් තුමා ජනතා හරසර මැද පැමිණි අතර බොහෝ දෙනෙකු තාපස දිවියට යොමු විය.

මේ නිසාම අතනාසියුස් තුමන් ඇලෙක්සැන්ඩ්‍රියාවේ විරයකු බවට පත් විය. නමුත් දෙවන කොන්සියස්ගේ කාලයේදී එනම් ක්‍රි.ව. 355 දී නැවත තර්ජන රැසක් එල්ලවීම නිසා රටින් පිටවීමට සිදුවිය. පියා මෙන් ඔහු ආරියුස්ට පක්ෂපාති විය. මේ නිසා ම අතනාසියුස් තුමා මිසරයේ කාන්තාර ප්‍රදේශයක තිබූ තාපසාරාමයකට ගිය අතර ක්‍රි.ව. 362 දී නැවත ඇලෙස්සැන්ඩ්‍රියාවට පැමිණ ජීවිතයේ අවසාන කාලය එහි ගත කළේය. ක්‍රි.ව. 373 දී මෙතුමා මිය යන තෙක් ඇලෙක්සැන්ඩ්‍රියාවේ අගරදගුරුධුරය දැරූ අතර සාමකාමී ලෙස තම රැළ පෝෂණය කළ සභා එඬේරෙකි.

අසේල දසනායක

# ප්‍රහේලිකා අංක 36



හරහට

1. උත්පත්ති පොතේ සඳහන් ආකාරයට එකල මිනිසුන් එකම භාෂාවක් කතා කළ අතර ඔවුන් අහස උසට නැගීම සඳහා මෙම කොත සාදා ගත්හ.

3. ක්‍රිස්තු උත්ථානයෙන් පසු උන්වහන්සේ තම ශ්‍රාවකයන් සිටින තැනට වැඩම කර "මාගේ... ඇලයද බලන්න. අවිශ්වාස නොකර විශ්වාස කරන්න." තෝමස් තුමාට වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

4. ක්‍රිස්තුන් වහන්සේ පේදුරුට කතා කොට "ස්වර්ග රාජ්‍යයේ.......මම ඔබට දෙන්නෙමි." වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

6. ක්‍රිස්තුන් වහන්සේ සමාරිය ස්ත්‍රියට කතා කොට " මට...... ටිකක් දෙන්නැයි" වදාළ සේක. හිස්තැනට සුදුසු වචනය.

7. "කරුණ ඔබට වැටහේ නම් ඔබේ අසල් වැසියාට පිළිතුරු දෙන්න. එසේ නොවේ නම්, ඔබේ අතින්..... වසා ගන්න" යනුවෙන් උපදේශකයා හෙවත් සිරාක් පවසයි.

8. ක්‍රිස්තුන් වහන්සේ පූප වැඩිකිරීමේ ප්‍රාතිහාර්යය සිදු කිරීමට පෙර එක් ශ්‍රාවකයෙක් උන්වහන්සේට කතා කොට,...... රොටි පහක් මසුන් දෙදෙනෙක් ද, සිටින පිරිමි ළමයෙක් එහි සිටින බවත්, මෙපමණ සෙනඟකට එයින් ප්‍රයෝජනයක් නොමැති බවත් පැවසුවේය. මෙහි හිස්තැනට සුදුසු වචනය.

10. කානාහි සරණ මංගල්‍යය අවස්ථාවේදී දේව මෑණියන් එහි මිදියුෂ නැති බව ක්‍රිස්තුන් වහන්සේට පැවසූ විට උන්වහන්සේ තම...... තවම පැමිණ නැති බව ප්‍රකාශ කළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

පහළට

1. ".... මා වෙතට එන්න ඉඩ දෙන්න. ඔවුන් නොවළක්වන්න. දෙවියන් වහන්සේගේ රාජ්‍යය මෙබඳු අය සන්තකය" යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. හිස් තැනට සුදුසු වචනය.

2. තම ගෝලයන්ගෙන් ඉතාම සුළු තැනැත්තෙකුට වුවද බොන්නට ඇල්වතුර කෝප්පයක් දෙන්නේ ද, ඔහුගේ පිපාසය නැති නොවන බව ආගන්තුක .... ට ලැබෙන විපාක පෙන්වීමේදී ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. හිස් තැනට සුදුසු වචනය.

5. "ස්ත්‍රියකගේ ...... නොරැවටෙන්න" යනුවෙන් උපදේශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

7. "ඔබේ සිරුරට පහන ඔබේ ඇසය. ඇස් පෙනුම හොඳ නම් මුළු සිරුරම ආලෝකවත් ය" ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි සිරුරට සමාන වචනයකි.

9. අන්ධයකුට මඟ පෙන්වීමට අන්ධයකුට හැකිද? ඔවුන් දෙදෙනාම .... වැටෙන්නේ නැද්ද? යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. හිස්තැනට සුදුසු වචනය.

**(මෙම ප්‍රහේලිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. ශු.මාක් 10:14, ශු. මතෙව් 16:19, 10:40, ශු. ජුවාම් 6:9, 2, 20:27,ශු. ලූක් 11:34, 6:39, ශු. ජුවාම් 4:7, උපදේශකයා හෙවත් සිරාක් 5:12, 25:21, උත්පත්ති 11)**

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා**

මීගමුව ආවේ මරියා කන්‍යාරාමයේ රොෂෙල් නතාෂා ඇස්කි පසුගියදා පැවති ''ශ්‍රී ලංකා පාසල් කේවල වෙස් තරගාවලිය 2012'' රන් පදක්කමක් දිනා ගැනීමට සමත්වූවාය.

ඇස්කි මීගමුව ආවේ මරියා කන්‍යාරාමයේ විදුහල්පතිනි ගරු ෂිරානි අල්ගම පැවිදි සොයුරිය සමඟ ඡායා රූපයකට පෙනී සිටි අයුරු.



**ළමා ප්‍රදීපය පාස්කු කලාපයට නිර්මාණ එවන්න.**

**ළමා ප්‍රදීපය විශේෂ පාස්කු කලාපය සඳහා පාස්කුව හා බැඳි ඔබගේ නිර්මාණ ( සඳැස්, නිසැඳැස්, ලිපි, කෙටි කතා ) අප වෙත යොමු කරන්න. ඔබගේ නිර්මාණ 2013 මාර්තු 10 වන දිනට පෙර,**

**ළමා ප්‍රදීපය "පාස්කු කලාපය" අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08. යන ලිපිනයට අප වෙත එවන්න.**

**සංස්කාරක පියතුමා**

**නිවැරදිව ප්‍රහේලිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්,**
**ප්‍රහේලිකා අංක 36, ළමා ප්‍රදීපය,**
**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,**
**කොළඹ 08 යන ලිපිනයට එවන්න.**


ආනන්ද කල්දේරාගේ
රජ කුමාරයයි කිඳුරු කුමාරියයි
දෙබස්, චිත්‍ර:-
ඇස්.ඒ.පාලිත සපුආරච්චි
35
අනේ.. අම්මා.. අ.. අ..
පුංචි ගයානිගෙ කෑගැහිල්ලට එයාගෙ අම්මා ඇවිත් ගයානි නිදාගෙන හිටපු කාමරයෙ ලයිට් එක දැම්මා...
කෝ අර කිඳුරු කුමාරි.. කුමාරයා.. අර යකා......
ටික්
ගයානි දූ.... මොකද හීනෙන් බය වුණාද.. ආ...
නාහෙට අඬ අඬා උන්න ගයානි ළඟට ආපු එයාගෙ අම්මා ගයානිගෙ ඔළුව අතගෑවා..
මගෙ හොඳ දූ ඔයා හීනෙන් බයවෙලා තියෙ.. න්නෙ..
එතකොටම පුංචි ගයානිගෙ තාත්තත් එතැනට ආවා..
ඇයි මොකද මේ දුව කෑගැහුවෙ?
මේ ළමය හීනයක් දැකල..
හොඳටම බය වෙලා..!
මෙච්චර වෙලා දැකල තියෙන්නෙ හීනයක් කියල ගයානි දැනගත්තෙ එතකොටයි..
..මේ ළමය රාත්‍රී යාඥාව එහෙම කරන්නෙ නැතුව නිදාගත්ත නේද?
යාඥා කරන්නෙ නැතුව නිදාගත්තම නපුරු හීන පේනව තමයි..
දැන් වෙලාව රෑ දොළහයි.. දැන්වත් යාඥා කරල නිදාගන්න..
පුංචි ගයානි ඒ වෙලාවෙම දණ ගහල අනේ.. ජේසුනි.. කියල යාඥා කරන්න පටං ගත්තා..
..අනේ.. ජේසුනි...
077 9886705 -S.A.P
යාඥා කරපු පුංචි ගයානි අන්තිමට රාත්‍රී ආරාධනාවත් කියල නිදාගත්තා...!
...ඊට පස්සෙනම් එයාට නරක හීන පෙනුනේ නෑ..
...පහුවෙනිදා නිවාඩු දවසක්.. හින්ද එයා දවල් වෙනකන්ම නිදාගත්තා...
නිමි
රජකුමාරයයි.. කිඳුරු කුමාරියයි ළමා කථාව පුංචි ඔබලාගේ "ළමා ප්‍රදීපයේ" පළකිරීමට අප හට අත හිත දී උදව් උපකාර කළ... ළමා ප්‍රදීපය සංස්කාරක ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමාටත්, සහාය සංස්කාරක කුමාර නයනජිත් මහත්මාටත්,.. කථා රචක ආනන්ද කල්දේරා සහ චිත්‍ර ශිල්පියා වන.. මගේ ගෞරවණීය ප්‍රණාමය මෙමගින්...
පුද කර සිටිමු
.... ආදරණීය.. අයියේ.. අක්කේ.. නංගී.. මල්ලී.. රජකුමාරයයි.. කිඳුරු කුමාරියයි ළමා කථාව කියවා වලා ඔබලා.. යම්කිසි රසවින්දනයක් ලැබුවානම් එය අප ලද ජයග්‍රහණයකි.. ඉමහත් සතුටකි..!
ඔබ සැමට ජේසු පිහිටයි..
කථා රචක.. ආනන්ද කල්දේරා සමග
චිත්‍ර ශිල්පී.. ඇස්. ඒ. පී. සපුආරච්චි..

## ශු. ප්‍රැන්සිස් මුණිඳුන්ගේ කතාව

# අසීසි නගරයේ දිළින්දා

ඉදිරිපත් කිරීම – අමල් ද සිල්වා

13




